# ගම්පහ ප්‍රාදේශීය සභාව

## කුලී පදනම මත කැබ් රථයක් සපයා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

## කොන්දේසි

- 2015 – 2020 වර්ෂය අතර නිෂ්පාදිත එන්ජින් ධාරිතාවය 2450 CC – 3000 CC අතර ලොව ප්‍රකට සන්නාම නාමයකින් යුත් වාහන මාදිලියක් විය යුතුය.
- ධාවන මීටරය කිලෝ මීටර 100,000 ට අඩු විය යුතු අතර ගියර් පද්ධතිය ඔටෝමැටික් හෝ මැනුවල් විය යුතුය.
- පූර්ණ වායු සමීකරණ සහිත බල සුක්කානම් (Power Steering) යුත් ABS බ්‍රේක් පද්ධතියක් සහිත රියදුරු හා සියළු මගීන් හට ආසන පටි සහ වායු බෑග් (Air Bag) සහිත ආරක්ෂිත රථයක් විය යුතුය.
- කුලී ආවරණය සහිත පූර්ණ රක්ෂණාවරණයක් තිබිය යුතුය. (කැරලි කෝලාහල, හදිසි අනතුරු, ගිනි රක්ෂණ, ස්වාභාවික විපත්, සොරකම, තෙවන පාර්ශව ආවරණය අවම වශයෙන් රු.ලක්ෂ 03ක් විය යුතුය, පෞද්ගලික රක්ෂණ වන්දි ආවරණය රථයේ ගමන් කරන එක් පුද්ගලයෙකුට අවම වශයෙන් රු.100000.00 ක් විය යුතුය, රියදුරු සඳහා කම්කරු රක්ෂණ වන්දි ආවරණය, ත්‍රස්ත විපත් ආවරණය ඇතුළත් විය යුතු අතර ඇමුණුම් සහිතව ඉදිරිපත් කළ යුතුය.)
- අළුත්වැඩියා හෝ හදිසි අනතුරු තත්වයකදී අදාළ අළුත්වැඩියාව නියමිත වේලාවට ලංසුකරු විසින් සිදුකළ යුතු අතර එන්ජිම දෝෂ රහිත, බඳ මලකඩ රහිත, රථය ඇතුළත සතුටුදායක තත්වයෙන් යුතු 4WD පද්ධතිය ඇතුළු අනෙකුත් පද්ධතීන් සහ උපාංග පූර්ණ ක්‍රියාකාරීත්වයෙන් යුක්ත විය යුතුය.
- සේවා අළුත්වැඩියා කිරීම්, බිඳ වැටීම් හෝ අනතුරු වලදී ඊට සමාන වර්ගයේ වාහනයක් පැය 24 ක් ඇතුළත ලබා දිය යුතුය.
- රථය, රියදුරු සහ ඉන්ධන රහිතව ලබාදිය යුතු අතර රථය අවම වශයෙන් මසකට 2000 KM ක් (සේවා සහ අළුත්වැඩියා හැර) ධාවනය කිරීමට අපේක්ෂිත අතර ඒ සඳහා වන මාසික ගාස්තුව සහ කිලෝමීටර 2000 ඉක්මවන අතිරේක කිලෝමීටරයට ගාස්තුව ඔබ විසින් ඉදිරිපත් කළ යුතුය.